දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ප්‍රථම භාග - 2015 හා 2019 (පුනර් 2015) පරීක්ෂණය - 2020 පෙබරවාරි/මාර්තු
Bachelor of Arts General (External) Degree Part I – 2015 & 2019 (2015 Repeat) Examination–February/March 2020

භූවිසා 2.1 - සම්පත් සංවර්ධනය හා සැලසුම්කරණය
GYG 2.1 - Resource Development and Planning

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න
පැහැදිලි අත් අකුරින් පිළිතුරු සපයන්න

---

01. i. "සම්පත් (Resources) යන්න අර්ථ දක්වන්න.

(ලකුණු 02)

ii. පෘථිවි ගෝලයේ දක්නට ලැබෙන සම්පත් වර්ගීකරණය කොට, කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

iii. සම්පත් පිළිබඳ මානව ඇගයුම පුළුල් වීම සඳහා බලපෑම් කෙරෙන සාධක හතරක් (04 ක්) නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 14)

02. "සම්පත් උපයෝජනය, සංවර්ධනය හා සංරක්ෂණයෙහි ලා මිනිසා තීරණාත්මක සාධකයකි". මෙම කරුණ තුන (03) වෙන් වෙන්ව ගෙන උදාහරණ දෙමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

03. සම්පත් පරිහරණය ආශ්‍රිත ගැටළු පහක් (05 ක්) තෝරාගත් සම්පත් කිහිපයක් ඇසුරින් නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

04. i. "ජල හිඟය" යනු කුමක්දැයි අර්ථ දක්වන්න.

(ලකුණු 02)

ii. ජල හඟතාවයට බලපාන සාධක හතරක් (04 ක්) දක්වා, නිදර්ශණාත්මකව පැහැදිලි කරන්න.

(ලකුණු 12)

iii. ශ්‍රී ලංකාවේ ජල සම්පත්වල ප්‍රාදේශීය විවිධත්වය සාකච්ඡා කරන්න.

(ලකුණු 06)

05. සංවර්ධනය වෙමින් පවතින රටවලට තිරසර සංවර්ධනය (Sustainable Development) ළඟා කර ගැනීමේ දී, එම රටවලට බලපෑම් කරන සාධක පහක් (05 ක්) සහ එම රටවල් එම බාධක දුරු කර ගැනීමට ගෙන තිබෙන ප්‍රතිපත්ති පහක් (05 ක්) නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

06. i. 2019 වන විට ගෝලීය ජනගහනය කොපමණදැයි පෙන්වා දී අධිකතම ජනසංඛ්‍යාවක් වෙසෙන කලාපය රටවල් අනුව පෙන්වා දෙන්න.

(ලකුණු 03)

ii. අධික ජන සංඛ්‍යාව හේතු කොට ගෙන, එම රටවල උද්ගත වී ඇති ගැටළු පහක් (05 ක්) සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

iii. ඉහත අධික ජන සංඛ්‍යාවක් සහිත රටවලට ජනසංඛ්‍යාව පාලනයට යොදා ගත හැකි විභව විසඳුම් දෙකක් (02 ක්) කෙටියෙන් පෙන්වා දෙන්න.

(ලකුණු 02)

07. i. සම්පත් සංරක්ෂණය හා කළමනාකරණය අර්ථ දක්වන්න.

(ලකුණු 02)

ii. සංවර්ධනය වෙමින් පවතින රටවල් සම්පත් සංරක්ෂණය හා කළමනාකරණය කෙරෙහි මුහුණ දිය යුත්තේ කෙසේ ද යන්න පිළිබඳව කරුණු හයක් (06 ක්) දක්වා නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 18)

08. පහත සඳහන් මාතෘකා අතුරින් දෙකක් (02 ක්) තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

I. ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO)
II. ශ්‍රී ලංකාවේ වන සම්පත්
III. එකසත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA)
IV. ආහාර සුරක්ෂිතතාව හා ගෝලීය ආහාර අර්බුධය

(ලකුණු 10X2 = 20)